## වන සත්ත්ව සංරක්ෂණ අරමුදල - 2018

-----------------------------------------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

වන සත්ත්ව සංරක්ෂණ අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී  ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2016 සහ 2017 වර්ෂවලදී ඉදි කිරීම් නිමකර තිබූ රු.52,368,026ක වත්කම් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලට දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) සත්ත්ව කූඩු ඉදිකිරීම සඳහා වැය වූ රු.812,496 ක මුදල ප්‍රාග්ධනිත නොකර වියදමක් ලෙස ලියාහැර තිබුණි. | සත්ත්ව කූඩු ප්‍රතිසංස්කරණය සඳහා වූ වියදමක් බැවින් එම මුදල ප්‍රාග්ධනිත කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ පවතින විවිධ ඖෂධ හා ඖෂධ උපකරණ අයිතම 171 කට අදාළ පිරිවැය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | ගබඩාවේ පවතින ඖෂධ හා ඖෂධ උපකරණ තොග ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය රු.74,740 ක් ලෙස ප්‍රධාන කාර්යාලයේ පශු වෛද්‍ය ඒකකයේ පවතින තොගය දක්වා ඇති බැවින්, ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ පවතින තොගය මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගෙවිය යුතු සේවා ගාස්තු ගිණුමේ වර්ෂ 05 ක් ඉක්ම වූ රු.10,679,146 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | සේවා ගාස්තු ගෙවනු ලබන්නේ අදාළ වර්ෂය සඳහා වැටුප් වර්ධක අනුමත කර ඇති නිලධාරීන්ට පමණක් වන බැවින්, වැටුප් වර්ධක අනුමත වූ පසු ගෙවීම සඳහා එය නොගෙවූ නිලධාරීන්ගේ සේවා ගාස්තු රඳවා තබා ගැනීමට සිදුවේ. | දීර්ඝකාලීනව රඳවා නොගෙන ගෙවිය යුතු මුදල් නිසි පරිදි පියවිය යුතුය. |

## 1.7 නීති,රීති හා විධිවිධානවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 නොවැම්බර් 08 දිනැති අංක 05/2009 දරන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | නීති අංශය තුළ ගිනිඅවි හා පතරොම් පිළිබඳව ලේඛනයක් පවත්වා නොතිබූ අතර, කලාප කාර්යාලවලින් මාසික වාර්තා නීති අංශය වෙත යොමුකර නොතිබුණි. | ඉදිරියේදී නීති අංශය තුළ ගිනි අවි හා පතරොම් පිළිබඳව ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇති අතර කලාප කාර්යාලවලින් ඊට අදාළ මාසික වාර්තා මාස්පතා ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුයි. |
| (ආ) | ඖෂධ හා ඖෂධ උපකරණ මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 | වටිනාකම රු.13,324,020 ක් වූ ඖෂධ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කර නොතිබුණි. | ඉදිරියේදී ඖෂධ හා ඖෂධ උපකරණ මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 - හි සඳහන් විධිවිධාන අනුව තාක්ෂණ ඇගයීම් කමිටු පත්කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට පියවර ගනිමි. | මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,871,142,266 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,546,489,131 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.324,653,135 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට උද්‍යාන පිවිසුම් ගාස්තු රු.350,476,437 කින් හා සේවා ගාස්තු රු.56,413,113 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2018 වර්ෂය වන විට තර්ජනයට ලක් වූ වනජීවී විශේෂයන්ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුති (CITES) සැසිවාර 17 හිදී එළඹුණු නිර්දේශයන් පාදක කර ගනිමින් සත්ව හා ශාක වෙළඳාම සහ අභිජනන කටයුතු විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට සුදුසු පරිදි නව නීති පද්ධතියක් හඳුන්වාදීම අවශ්‍ය වන නමුත් 2019 අප්‍රේල් 30 දින වන විටත් නීති පද්ධතියක් හඳුන්වාදී නොතිබුණි. | රෙගුලාසි ගැසට් කිරීම සඳහා නීති කෙටුම්පත් සකස් කර නීතිපති දෙපාර්තමේන්තුව වෙත දැනට වසර කිහිපයකට පෙර ඉදිරිපත් කර ඇති අතර, මේ වන විට ඒවා නීතිගත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | ශ්‍රී ලංකාවට සුදුසු පරිදි නව නීති පද්ධතියක් හඳුන්වාදිය යුතුය. |
| (ආ) | ශාක හා සත්ව වෙළඳාම හේතුවෙන් ශාක හා සත්ව කොටස්වලට සිදු වන බලපෑම අධ්‍යයනය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කළ යුතු වුවත් 2016 වර්ෂයේ සිට 2018 ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ සිදු කළ ආනයන අවස්ථා 75 කට අදාළව ක්ෂේත්‍ර පරීක්ෂාවන් අවස්ථා 08 කදී පමණක් සිදුකර තිබුණි. Borneo Exotics නැමැති බාඳුරා අපනයන ආයතනය සම්බන්ධයෙන්ද 2013 වර්ෂයෙන් පසුව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | Borneo Exotics (Pvt) Ltd වෙත ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කළ නොහැකි වූ අතර, 2019 වර්ෂයේදී ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකිරීමට යෝජිතව ඇත. | ආනයන හා අපනයන හේතුවෙන් සිදු වන බලපෑම් ඇගයීමට ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අගෝස්තු 23 දින රු.527,620 ක් වූ Stress Vitamin කිලෝ ග්‍රෑම් 227 ක් මිලදී ගෙන තිබුණු අතර එම මුළු ප්‍රමාණයම උඩවලව ඇත් අතුරු සෙවණට ලබාදී තිබුණි. 2019 ඔක්තෝබර් වන විට ඉන් ඖෂධ කිලෝ ග්‍රෑම් 98 ක් කල් ඉකුත් වන අතර එහි වටිනාකම රු.258,006 ක් විය. | සතුන් සඳහා ඖෂධ මිලදී ගනු ලබන්නේ කලාප භාර පශු වෛද්‍ය නිලධාරීන්ගේ ඉල්ලීම් හා අධ්‍යක්ෂ (සෞඛ්‍ය) ගේ නිර්දේශය පරිදිය. ඒ අනුව Stress Vitamin ඖෂධ මිලදී ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව සිදු කර ඇති අතර, දැනට උඩවලව ඇත් අතුරු සෙවනේ සතුන් සඳහා භාවිතා කරනු ලබයි. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගැනීම කළ යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2012 වර්ෂයේදී රු.11,730,808 ක් වැය කර ඉදිකර තිබුණු විල්පත්තුව ජාතික උද්‍යානයේ පිහිටි කොල්ලන්කනත්ත (විවල) සංචාරක බංගලාවේ ජල ගැටළු පැවතීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට භාවිත නොකර නිෂ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේදී ජල ගැටළුව නිරාකරණය කර සංචාරකයින් සඳහා විවෘත කිරීමට බලාපොරොත්තු වෙමි. | ජල ගැටළුව නිරාකරණය සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |
| (ආ) | මුහුදු ක්ෂීරපායි සතුන්ගේ සංරක්ෂණය හා සංචාරක කටයුතු අධීක්ෂණය වෙනුවෙන් 2017 හා 2018 වර්ෂවලදී මිලදී ගනු ලැබූ Wave Rider යාත්‍රාව සහ එංජින් සඳහා රු.5,868,600 ක් වැය කර තිබුණි. එසේ වුවද 2019 වර්ෂයේදී වගකීම් කාලය ඉක්මවා ඇතත් භාවිත නොකර මිරිස්ස වරායේ නිෂ්ක්‍රීයව පැවතින. | මෙම යාත්‍රාව මේ වන විට ධාවනය සඳහා යොදා ගනු ලබන අතර, ගැඹුරු මුහුදේ ධාවනයන් සඳහා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | යාත්‍රාව වහාම භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලට නව කොටසක් ඉදි කිරීම සඳහා රු.6,322,500 ක් වූ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ අත්තිකාරම් වශයෙන් 2017 සැප්තැම්බර් 11 දින රු.1,264,500 ක් ගෙවා තිබුණි. එසේ වුවද ගිවිසුම ප්‍රකාරව 2018 පෙබරවාරි වැඩ අවසන් කළ යුතුව තිබුණද, 2019 අප්‍රේල් 30 වන විටත් ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 15 ක් පමණක් විය. | මෙම ඉදිකිරීම සිදුකරගෙන යාමේදී ඇස්තමේන්තුවට අදාළව වහලයේ ඉදිකිරීම ප්‍රධාන ගොඩනැගිල්ලේ පෙනුමට නොගැලපෙන බැවින් පැවති ඇස්තමේන්තුව සංශෝධනය කළද එය සියයට 24.2 ක වැඩි වීමකි. එය ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය සීමාව වන සියයට 10 වඩා වැඩි වන බැවින් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට යවා ඇත. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කර ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කළ යුතුය. |